

# චූටියා

මහිඳි බාලසූර්ය

# චූටියා

මහිඳි බාලසූරිය

ප්‍රථම මුද්‍රණය : 2025.02.08

කර්තෘ : මහිදු බාලසූරිය

ලිපිනය : නො.178/B, ජයශ්‍රී උයන, රණවිරු මාවත,
පල්ලේකැලේ.

ISBN අංකය : 978-624-208-697-2

මුද්‍රණය :
"PRESS"
නො.24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

නිති දැනුමෙන් පෝෂණය කරන්නට වෙර දරන,

මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,

පන්තිභාර ගුරුතුමිය,

ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,

මා පෝෂණය කරන, ඇතිදැඩි කරන

මාගේ මව්නි, පියාණෙනි ඔබ දෙපලටත්,

මා වැනිම දැනුම හඹා යන

මාගේ සොයුරු කැළටත්

මේ පොත ආදරයෙන් පුද කරමි.

* * *

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එදා වැස්ස දවසක්, අප්පච්චි මොකද්ද ඒ ශබ්දය බලු පැටවු කෑ ගසනවා නේද ?

අපි බලමු අප්පච්චි. අනේ පුංචි බලු පැටව් තුන්දෙනෙක් පච් තෙමිලා නේද ? අපි ගිහිල්ලා අරන් එමු.





අනේ අම්මේ කොහෙද ඉන්නේ ?

අපිට බඩගිනි. අපිව තෙමෙනවා. අපිව බේරගන්න.

නංගී,මල්ලී බයවෙන්න එපා මම ඉන්නවනේ. අන්න බබෙක් එනවා මේ පැත්තට.

අප්පච්චි අර බලු පැටව් ගේන්න. ආ මෙන්න පෙට්ටියක් මෙකෙත් තියන්න අප්පච්චි. මේගොල්ලොන්ට බඩගිනි ඇති නේද ?

ඔව් පුතේ අපි එයාලට කිරි හදලා දෙමු. අප්පච්චි මගේ බනිස් ගෙඩියක් දෙමු නේද? හොඳයි පුතේ.

අප්පච්චි මම මේගොල්ලන්ට නම් දාන්නද ? හා පුතේ

ඔයා චූටි, ඔයා රූසී, ඔයා බූලා බබා කිවුවා.

අප්පච්චි බබයි අපිට කෑම දුන්නා. එන්න අපි ඒවා ගිහිල්ලා කමු. හරිම රසයි නේද.

මේ කිරි බොන්න ඔයාලා බය වෙන්න එපා මම ඉන්නවනේ අපි සෙල්ලම් කරමු. අපිට මේ ගෙදර අය හොඳයි වගේ



අනේ අප්පච්චි මම අද ඉස්කෝලේ යනවා. අම්මයි අප්පච්චිත් ගෙදර නෑ. අපි මෙයාලාව බලා ගන්නේ කොහොමද ? අපි කන්න දීලා බොන්න දීලා යමු.

ඒත් අප්පච්චි මට බයයි එයාලා අපිට නැති වෙයි කියලා.

ඔයා බය වෙන්න එපා පුතේ.



අන්න බබයි ගෙදර ඔක්කොම යනවා. එයාලා කොහෙද යන්නේ අපි බලමු. එන්න අපි පාරට යමු. මොකද්ද ඒ ශබ්දය බබාලා පුටු පුටු ගාලා ගියා අපි ඉස්සරහට ගිහින් බලමු.


අන්න කව්දෝ එනවා. මල්ලිව වඩා ගත්තා නේද ? ඔව් ඔව් අපි දුවමු.... අපි දුවමු.... අනේ මගේ මල්ලිව තියලා යන්න. අන්න බබයි ගෙදර අයයි එනවා. යමු... යමු... අපි කියමු.



අප්පච්චි බූලා කෝ. එයා කවුදෝ අරගෙන ගිහින් වගේ අපි හොයමු.

බූලා ... බූලා ... බූලා ... එයා නැහැ. පුතේ ඔයා අඬන්න එපා අපි මේ දෙන්නව බලා ගනිමු.

චූටී ... රූසී ... එන්න අපි කෑම කමු.




අදත් ගෙදර අය යනවා. අපි දෙන්නා පාරට ගිහින් සෙල්ලම් කරමු.

අනේ මගේ නංගිව තියලා යන්න.

මම දුවලා බේරෙන්න ඕනේ.

මගේ නංගි වත් අරගෙන ගියා මම තනි වුණා.

බබා එනවා.





අප්පච්චි මගේ රුසීත් නෑ. අනේ මට එයාව හොයලා දෙන්නකෝ. අප්පච්චි මට චූටිත් නැති වෙයිද ?

නෑ පුතේ අපි එයාව ආරක්ෂා කරගමු. මම දැම්ම කූඩුවක් හදන්නම්. චූටිත් පාරට ගියොත් එයාවත් කව්රු හරි අරගෙන යයි.

අපි මෙයාව කූඩුවට දාලා යමු.

අපි සතුන්ව ආරක්ෂා කරන්න ඕනේ.

රැක බලා ගන්න ඕනේ.

අපි සතුන්ට ආදරය කරමු.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට අල්බක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තරබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.